ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணத் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு
MINISTRY OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING

මගේ අංකය. / எனது இல. / My No. 1/9/6/I (i)    ඔබේ අංකය. / உமது இல. / Your No.    දිනය. / திகதி / Date 2025-03-19

ප්‍රධාන විධායක නිලධාරී,
ජාතික ඉදිකිරීම් සංගමය,
350/ඒ, "ඉදිකිරීම් මැඳුර",
පන්නිපිටිය පාර, පැලවත්ත,
බත්තරමුල්ල,

මහත්මයාණෙනි,

<u>සිඩා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා ඇගයීම් නිර්ණායක ලිහිල් කිරීම හා හිඟ මුදල් ගෙවීම නිදහස් කිරීමේ කාලය දීර්ඝ කිරීම</u>

ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගත කිරීම හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයට අදාළව, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලෙස 2022.12.31 දින දක්වා සිඩා ලියාපදිංචිය ලබා ගත් කොන්ත්‍රාත්කරුවන් සඳහා පහත සහන ක්‍රියාත්මක කිරීම දීර්ඝ කිරීමට 2025.01.22 දින පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව පහත සඳහන් සහන ලබා දී ඇත.

1. 2022.12.31 දිනෙන් පසු මේ දක්වා තම ලියාපදිංචිය අලුත් කිරීම / දීර්ඝ කිරීම කර නොමැති C4 සිට C9 දක්වා කොන්ත්‍රාත්කරුවන් සඳහා අවුරුදු 03ක හිඟ මුදල් ගෙවීම නිදහස් කිරීම. (සහන කාලය 2025.03.31 දක්වා දීර්ඝ කර ඇත.)
2. C3, C2 හා C1 දක්වා කොන්ත්‍රාත්කරුවන්ගේ අවුරුදු 03ක හිඟ මුදල් මාස 06ක් ඇතුලත වාරික 02කින් ගෙවීමට අවස්ථාව ලබා දීම.
3. මෙම සහන කාල සීමාව මාස 03ක් සඳහා වලංගු වන හෙයින් 2025 මාර්තු මස 31 දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.
4. සාමාන්‍යයන් අයදුම්පත් ඇගයීමේදී සිදුවන ක්‍රමවේදය සහන කාල සීමාවේදී ද අදාළ වීම.
5. අවුරුදු 03කට වඩා වැඩි හිඟ මුදල් සඳහා දැනට පවතින ගාස්තු අනුව අයකිරීමට කටයුතු කිරීම.
6. ඉහත 02 යටතේ සඳහන් සහන ක්‍රියාත්මක කිරීම එකී එම කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා ලියාපදිංචි කමිටුව මගින් නිශ්චිත ලියාපදිංචිය අනුමත කළ දින සිට බලාත්මක කිරීම.

ඇගයීම් නිර්ණායක ලිහිල් කිරීම - මෙය 2025.12.31 දක්වා දීර්ඝ කර ඇත.

| අංක | ප්‍රධාන ක්ෂේත්‍ර | ලිහිල් කිරීම |
|---|---|---|
| 1. | මූල්‍යමය හැකියාව | C9 සිට C4 ශ්‍රේණිය දක්වා සහතික කළ ලැබිය යුතු ගෙවීම් වාර්ථා |
| 2. | තාක්ෂණික හැකියාව<br>මානව සම්පත<br>a) වෘත්තීය කාර්ය මණ්ඩලය<br>b) අධීක්ෂණ කාර්ය මණ්ඩලය<br>c) NVQ III මට්ටමේ කාර්ය මණ්ඩලය | a හා b EPF වාර්තා ලබා දීම අවුරුද්දක කාලයක් සඳහා ලිහිල් කර ඇත.<br><br>c අවුරුද්දක සහන කාලයක් ලබා දී ඇත. |
| 3. | සැලකිය යුතු වෙනත් කරුණු<br>• අඛණ්ඩ හැකියා වර්ධනය (CCD)<br>• පුහුණු වන්නන් සඳහා ප්‍රතිපාදන සැපයීම<br>• සාමූහික සමාජ වගකීම (CSR) | අවුරුද්දක සහන කාලයක් ලබා දී ඇත. |

කෙසේ වෙතත් ඉදිකිරීම් කාර්ය සුරක්ෂිතතාව හා වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධ නිලධාරීන් (CSOH Staff) යෙදවීමට අදාල නිර්ණායක ලිහිල් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

**ස්තූතියි,**

**ඉංජි. එස්.කේ.එස්. අමරසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**